ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)උපාධි වැඩසටහන- 5 වන මට්ටම 2020/2021

අවසාන පරීක්ෂණය - 2021

අධ්‍යාපනයේ නව ප්‍රවණතා - SNU5239/ESU3139

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2021.08.07 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. විශේෂිත තත්ව යටතේ ස්ථාපිත (ස්ථානගතකළ) ළමයින්ගේ අයිතිවාසිකම් සඳහා සහයවන ජාත්‍යන්තර ලේඛන පහක් (05) නම් කරන්න.

02. විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා නොවිධිමත් අධ්‍යාපනයට සහ විය හැකි ආකාර තුනක් (03) සඳහන් කරන්න.

03. අන්තර්කරණ අධ්‍යාපනය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට සහය වන විචල්‍යයන් අවම වශයෙන් පහක් (05) සඳහන් කරන්න.

04. ශ්‍රී ලංකාවේ ආබාධ සහිත දරුවන් සඳහා රාජ්‍ය කැපවීම සනාථ කරන ජාතික ලියකියවිලි පහක් (05) නම් කරන්න.

05. 1990 සැමට අධ්‍යාපන අරමුණු අවම වශයෙන් පහක් (05) නම් කරන්න.

06. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ අධ්‍යාපන පනතෙහි IDEA (2004) මූලධර්ම අවම වශයෙන් පහක් (05) ක් සඳහන් කරන්න.

07. අන්තර්කරණ අධ්‍යාපනය කණ්ඩායම් ප්‍රවේශයක් ලෙස විස්තර කරන්නේ ඇයි? සුදුසු උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන පද්ධතියේ සේවාවන් තුල දැනට පවතින අභියෝග අවම වශයෙන් පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (I) "1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ (CRC), දරුවන්ගේ මූලික රැකවරණය හා ආරක්ෂාව පිළිබඳ පවුල සතු වගකීම අවධාරණය කරයි."

ඉහත ප්‍රකාශය සුදුසු උදාහරණ සමග විභාග කරන්න. (ලකුණු 10)

(II) ඉහත සඳහන් කළ අදහස් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවෙකු සිටින පවුලකට අදාල වන ආකාරය සුදුසු උදාහරණ දක්වමින් පැහැදිළි කරන්න. (ලකුණු 10)

10. (I) අවිධිමත් අධ්‍යාපනය නිර්වචනය කර විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ සංවර්ධනය සඳහා අවිධිමත් අධ්‍යාපනය වැදගත් කාර්ය භාරයක් ඉටුකරන ආකාරය පැහැදිලි කරන්න. සුදුසු උදාහරණ සපයන්න. (ලකුණු 08)

(II) 'දූරස්ථ අධ්‍යාපනය සහ අඛණ්ඩ අධ්‍යාපනය ඔස්සේ යාවජීව අධ්‍යාපනයට ඉඩ සැලසේ.'

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් අධ්‍යාපනය සඳහා යාවජීව අධ්‍යාපනයේ වඩා වැදගත් වී ඇති ආකාරය උදාහරණ සහිතව හේතු පැහැදිලි කරන්න. (ලකුණු 12)

11. (I) ශ්‍රී ලංකාවේ පැරණි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, ප්‍රඥප්ති/ප්‍රතිපත්ති අවම වශයෙන් තුනක් සන්සන්දනය කර විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ට අධ්‍යාපන අවස්ථා ලබාදීම සහ ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය විධිවිධාන විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

(II) ළමුන්ව අධ්‍යාපනික බැහැර කිරීම (Educational exclusion) යනු කුමක්දැයි ප්‍රායෝගික උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10)

12. (I) 'සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් ඇතුලත් කිරීමට පෙරපාසල් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකල යුතුය.'

ඉහත කියමන සුදුසු උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 08)

(II) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුවෙක් ට සාර්ථකව තම පාසල් අධ්‍යාපනය ආරම්භ කිරීමට පෙර පාසල් අධ්‍යාපන ක්‍රමය හා ප්‍රාථමික පාසල් අධ්‍යාපන ක්‍රමය සහයෝගයෙන් යුතුව සහය දැක්විය යුතු ආකාරය සුදුසු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

13. (I) ඒකීකරණයේ අදියර හතර (04) ක් දක්වන්න. ඉන් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ගේ සංවර්ධනය සඳහා වඩා වැදගත් අදියර කුමක්දැයි පැහැදිලි කරන්න. ඔබගේ පිළිතුර සාධාරණීකරණය සඳහා සුදුසු උදාහරණ සපයන්න. (ලකුණු 10)

(II) සැමට අධ්‍යාපනය පිළිබඳ ලෝක ප්‍රකාශනය (EFA,1990) සහ සලමන්කා ප්‍රකාශය (1994) මගින් ලෝකයේ අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රායෝගිකව ආරම්භ කළ හැක්කේ කෙසේදැයි උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

14. (I) දුබලතා සහිත සිසුන්ගේ අධ්‍යාපනයේ සාර්ථකත්වය උදෙසා ළමා අයිතිවාසිකම් භාවිතයන් වැඩිදියුණු කිරීමට යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

(II) විශේෂිත තත්ව යටතේ ස්ථාපිත දරුවන්ගේ අයිතිවාසිකම් සහතික කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන වගන්ති දක්වන්න. ඉන් වගන්ති දෙකක් (02) ගෙන විශේෂිත තත්වයන් යටතේ තබා ඇති දරුවන්ගේ අයිතිවාසිකම් සහතික කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.